# මෙහෙයුම් පද්ධති

පරිගණක මෘදුකාංග හා දෘඩාංග කළමණාකරණය කර පරිශීලකයන්ට එම සම්පත්වලට ප්‍රවේශ වීමට අතුරු මුහුණතක් සැපයීම සිදු කරන පද්ධතිය මෙහෙයුම් පද්ධතිය ලෙස හැඳින්වේ.

පරිශීලකයා විසින් භාවිතා කරනු ලබන යෙදුම් මෘදුකාංග හා උපයෝගිතා මෘදුකාංග පරිගණක දෘඩාංග සඳහා සම්බන්ධ කරනු ලබන්නේද මෙහෙයුම් පද්ධතිය විසිනි.

<u>යෙදුම් මෘදුකාංග</u>

එදිනෙදා වැඩ කටයුතු කිරීම සඳහා උපයෝගි වන මෘදුකාංග "යෙදුම් මෘදුකාංග" නම් වේ. උදා :- MS Word , Excel

<u>උපයෝගිතා මෘදුකාංග</u>

මෙහෙයුම් පද්ධතියේ ක්‍රියාකාරීත්වය තව දුරටත් කාර්යක්ෂම කිරීම හා වැඩි දියුණු කිරීමට භාවිතා වන මෘදුකාංග "උපයෝගිත මෘදුකාංග" ලෙස හැඳින්වේ. උදා - ප්‍රතිවෛරස් මෘදුකාංග

## <u>මෙහෙයුම් පද්ධතියක මූලික ක්‍රියාකාරීත්වය</u>

මෙහි ප්‍රධාන කොටස් 5 කි

1. මතක කළමණාකරණය (Memory Management)
2. ක්‍රියාවලි කළමණාකරණය ( Process Management )
3. උපාංග කළමණාකරණය ( Devices Management )
4. ගොනු කළමණාකරණය ( File Management )
5. ආරක්ෂණ කළමණාකරණය ( Security Management)

## <u>පරිශීලක අතුරු මුහුණත්</u>

මේවා දෙයාකාර වේ.

1. විධාන පේළි අතුරු මුහුණත් (CLI)
   Command Line Interface

2. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් ( GUI )
   Graphical User Interface

විධාන පේළි අතුරු මුහුණත් ( CLI )

තිරය මත ප්‍රේරකයක් දැකිය හැකි අතර ඒ මත විධාන යතුරු ලියනය කළ යුතුය. උදා. MS DOS , Unix , Linux

චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් ( GUI )

විධාන වෙනුවට රූපක / චිත්‍රක භාවිතයෙන් පරිගණකය හැසිරවීමට සැකසී ඇති අතුරු මුහුණත මෙයින් අදහස් කෙරේ.

Hareendra Jayanath Perera
voice 071 4409553 Fax 071 8802612 E-mail hareendra_lk@yahoo.com
web www.hareendraperera.webs.com

උදා - Wndows

විත්‍රක පරිශීලක අතුරු මුහුණත් භාවිතයේ ඇති වාසි

1. සරල වීම. (විධාන මතක තබා ගැනීමක් අවශ්‍ය නොවේ)
2. පරිගණක ක්‍රමලේඛ හැසිරවීම පිළිබඳ මනා දැනුමක් අවශ්‍ය නොවීම
3. බොහෝ විට තිරය මත ඇති අයිකන පිළිබඳ විස්තරයක් කෙරෙන කුඩා වාක්‍ය ඛණ්ඩයක් (Tool tips) දැකිය හැකි වීම.

Hareendra Jayanath Perera
voice 071 4409553 Fax 071 8802612 E-mail hareendra_lk@yahoo.com
web www.hareendraperera.webs.com